**පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - (මධ්‍යම හා සබරගමුව පළාත්) - 2015**

-----------------------------------------------------------------------------------------------

පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ - (මධ්‍යම හා සබරගමුව පළාත්) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹී අංක එස්එල් - පී 96 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (මධ්‍යම හා සබරගමුව) ණය ගිවිසුම අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මධ්‍යම හා සබරගමුව පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම හා ඉහළ නැංවීම මගින් විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව සඳහා මාර්ග ජාලයෙහි සම්බන්ධතාවය හා විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම මෙන්ම මාර්ග නියෝජිතායතන හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම සහ ඒ අනුව දේශීය ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම හා ප්‍රාදේශීය විෂමතාවයන් අඩු කිරීමත් ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,187 කට සමාන ජපන් යෙන් මිලියන 11,171 ක් වන අතර ඉන් රු.මිලියන 11,628 කට සමාන ජපන් යෙන් මිලියන 9,156 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 සැප්තැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2014 ජනවාරි වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2015 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (යෙන්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේ ද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව.

(ඉ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (යෙන්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
---------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

ව්‍යාපෘතියේ වාර්තා අනුව, රු.263,978 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ලීබඩු හා කාර්යාල උපකරණ විෂයයන් 45 ක් සමාලෝචිත වර්ෂය තුළදී වෙන්දේසියක් මඟින් අපහරණය කර තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අදාළ වත්කම්වල පිරිවැය රු.182,235 ක් ලෙස දක්වා තිබුණි. තවද ඒ සඳහා විකුණුම්වලින් ලැබුණු රු.14,150 ක මුදල් මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ගිණුම්වල ආදායමක් ලෙස සලකා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය
------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 9,156.00 | 11,628.00 | 2,420.51 | 1,727.19 | 2,200.29 | 9,143.65 | 11,943.46 |
| ශ්‍රීලංර | 2,015.00 | 2,559.00 | 543.92 | 412.93 | 484.32 | 1,353.99 | 1,620.31 |
| එකතුව | 11,171.00 | 14,187.00 | 2,964.43 | 2,140.12 | 2,684.61 | 10,497.64 | 13,563.77 |

**3.2** **භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මධ්‍යම පළාතේ පළාත් මාර්ග 15 ක කිලෝමීටර් 168.5 ක් සහ සබරගමුව පළාතේ පළාත් මාර්ග 18 ක කිලෝමීටර් 181 ක් පුනරුත්ථාපන කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා අදියර 03 ක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් සිදු කර තිබුණි. ව්‍යාපෘති නිම කිරීමේ වාර්තාව අනුව, මධ්‍යම පළාතේ පළාත් මාර්ග 15 ක කිලෝමීටර් 163.55 ක හා සබරගමුව පළාතේ පළාත් මාර්ග 17 ක කිලෝමීටර් 137.53 ක පුනරුත්ථාපන වැඩ සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත්, ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ සැලකිය යුතු ලෙස නිම කර තිබූ අතර කොන්ත්‍රාත්කරුවන්ගේ පසුව සිදු වූ අසාර්ථකවීම් හා මිල වැඩිවීම් ආදිය හේතුවෙන් සබරගමුව පළාතේ මාර්ග පුනරුත්ථාපන වැඩවල විෂය පථය අඩු කර තිබුණි. කෙසේ වුවද පළාත් මාර්ග කිහිපයක පුනරුත්ථාපන වැඩ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් භාරගෙන තිබූ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ විෂය පථය අඩු කළ බවත් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පැහැදිලි කර තිබුණි.

(ආ) ඉහත සඳහන් පරිදි, ව්‍යාපෘති නිම කිරීම් වාර්තාව අනුව, ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයට පළාත් මාර්ග පුනරුත්ථාපනය බොහෝ දුරට නිම කර තිබුණි. කෙසේ වුවද විවිධ කරුණු හේතුවෙන් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයට පුනරුත්ථාපන වැඩ කිහිපයක් නිම කිරීමෙන් තොරව පැවතුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. නිරීක්ෂණය වූ අවස්ථා පහත පරිදි විස්තර කෙරේ.

(i) රු.මිලියන 199.26 ක් හා රු.මිලියන 330 ක පිරිවැයකට ව්‍යාපෘතියේ අදියර 02 යටතේ සිදු කර තිබුණු මධ්‍යම පළාතේ පිළිවෙලින් අම්පිටිය - උඩවෙල මාර්ගයේ කිලෝමීටර් 05 ක හා නිල්දණ්ඩාහින්න - වටුමුල්ල මාර්ගයේ කිලෝමීටර් 6.76 ක පුනරුත්ථාපන වැඩ මාර්ගයේ කොටස් කිහිපයක් නායයාම් හේතුකොට ගෙන පසුව අසාර්ථක වී තිබුණි. නැවත සැලසුම් කිරීම හා නව ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම ආදිය සඳහා රු.මිලියන 1.72 ක පිරිවැයකට 2015 අගෝස්තු මාසයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් උපදේශක සේවා ලබා ගෙන තිබූ අතර රු.මිලියන 50.28

ක පිරිවැයකට ඒ සඳහා කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. කෙසේ වුවද අම්පිටිය - උඩවෙල මාර්ගයේ කිලෝමීටර් 2+512 සිට කිලෝමීටර් 2+530 දක්වා හා නිල්දණ්ඩාහින්න වටුමුල්ල මාර්ගයේ කිලෝමීටර් 18+215 සිට 18+265 දක්වා සහ කිලෝමීටර් 23+460 සිට කිලෝමීටර් 23+560 දක්වා ස්ථානවල වැඩිදියුණු කිරීම් පිළිබඳ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) සබරගමුව පළාතේ මාවෙල - වෙලන්ගේ - රුක්අත්තන මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා රු.මිලියන 255 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනමන ලද කොන්ත්‍රාත්තුව රු.මිලියන 130 ක් වටිනා වැඩ නිම කිරීමෙන් පසුව මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් 2015 අප්‍රේල් මාසයේදී නවතා තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් කරන ලද අභියාචනා මත එම කොන්ත්‍රාත්කරුටම නැවත පිරිනමා තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුගේ අසාර්ථක වීම් හේතුවෙන් කොන්ත්‍රාත්තුව නැවත නවතා තිබූ අතර රු.මිලියන 115 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2015 සැප්තැම්බර් මාසයේදී වෙනත් පාර්ශවයකට නැවත පිරිනමා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග පුනරුත්ථාපන වැඩ පිළිබඳ ආරම්භක ඇස්තමේන්තුගත පිරිවැයට සාපේක්ෂව වැය කරන ලද තථ්‍ය පිරිවැය පිළිබඳ සැලකිය යුතු විචලනයන් විගණනයේදී නිරීක්ෂණය විය. විධිමත් බිම් සමීක්ෂණ පදනම් කරගෙන අදාළ වැඩ පිළිබඳ ප්‍රමාණ පත්‍ර පිළියෙල කර නොතිබූ බව එයින් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | පැකේජ සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය | තථ්‍ය පිරිවැය | (අතිරේක පිරිවැය)/ ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **මධ්‍යම පළාත** | | | | |
| අදියර - I | 06 | 2,040.0 | 2,050.4 | (10.5) |
| අදියර -II – I | 06 | 1,170.0 | 1,152.4 | 17.6 |
| අදියර -II – II | 10 | 2,298.6 | 2,379.2 | (80.6) |
| අදියර -III | 03 | 59.0 | 56.4 | 2.6 |
| ප්‍රජා මූල සංවිධාන විසින් පුනරුත්ථාපනය කරන ලද මාර්ග | 15 | 3.0 | 28.8 | (25.8) |
| | | 5,570.6 | 5,667.2 | (96.7) |

**සබරගමුව පළාත**

| | | | | |
|---|---|---|---|---|
| අදියර - I | 05 | 1,624.4 | 1,567.6 | 56.8 |
| අදියර -II – I | 05 | 1,700.6 | 1,542.8 | 157.8 |
| අදියර -II – II | 06 | 1,824.3 | 1,598.9 | 225.4 |
| අදියර -III | 01 | 255.1 | 130.1 | 125.0 |
| ඉතිරි වැඩ | | 115.5 | 88.4 | 27.1 |
| ප්‍රජා මූල සංවිධාන විසින් පුනරුත්ථාපනය කරන ලද මාර්ග | 10 | 2.0 | 16.4 | (14.4) |
| | | 5,521.9 | 4,944.2 | 577.7 |

(ආ) පරිචයක් වශයෙන්, ව්‍යාපෘතිය විසින් අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් කරන ලද ඉල්ලීම් මත ද්‍රව්‍ය සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් සෘජුවම ගෙවා තිබූ අතර එමඟින් ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන්ට නොලැබිය යුතු මූල්‍ය වාසි ලබා දී තිබුණි. මධ්‍යම පළාතේ සිදු කරන ලද මාර්ග පුනරුත්ථාපන වැඩ 03 ක් මත සමාලෝචිත වර්ෂය තුළදී ද්‍රව්‍ය සැපයුම්කරුවන් සඳහා එකතුව රු.මිලියන 2 ක අත්තිකාරම් මුදා හැර තිබූ බව නියැදි පරීක්ෂණ වලදී අනාවරණය විය.

(ඇ) කොන්ත්‍රාත්කරුවන් විසින් නිම කරන ලද වැඩ සඳහා ඉල්ලීම් කරන ලද ගෙවීම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් මත පැකේජ 03 ක් යටතේ මාර්ග පුනරුත්ථාපන වැඩවල යෙදී සිටි කොන්ත්‍රාත්කරුවන් සඳහා ව්‍යාපෘතිය විසින් එකතුව රු.මිලියන 3.31 ක් වූ පොලී ගාස්තු ගෙවා තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 18 දින විගණකවරුන් විසින් කරන ලද වැඩබිම් පරීක්ෂාවේදී පුනරුත්ථාපනය කර 2014 ජුලි 21 දින පළාත් බලධාරීන්ට භාරදෙන ලද සබරගමුව පළාතේ උතුවන්කන්ද - උස්සාපිටිය මාර්ගයේ ස්ථාන 22 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් හානි කර තිබූ බවත් මාර්ගය පිළිසකර කිරීමට පියවර ගෙන නොතිබූ බවත් අනාවරණය විය. අදාළ ආයතන විසින් සම්බන්ධීකරණ කාර්යයන් සඳහා විධිමත් පරිචයන් පවත්වා ගෙන තිබුණේ නම් එවැනි අවස්ථා වළක්වා ගත හැකිව තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) යාන්ත්‍රිකව ක්‍රියාත්මක කරන බිටුමන් ස්ප්‍රේකරන යන්ත්‍රය (Bitumen Spraying Bourse) ප්‍රසම්පාදනය කිරීම සඳහා කරන ලද රු.මිලියන 12 ක වෙන්කිරීම, සුදුසු සැපයුම්කරුවකු තෝරාගැනීමට නොහැකි වීම හේතුවෙන් අරමුණු කළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

මධ්‍යම පළාතේ මාර්ග පුනරුත්ථාපන වැඩවල යෙදී සිටි කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු විසින් කරන ලද තීරක ඉල්ලුම්පත් මත විය හැකි බැරකම් දැරීම සඳහා මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ රු.මිලියන 29.98 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට රඳවා තබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

## 3.5 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

ව්‍යාපෘතිය විසින් මධ්‍යම පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා 2014 ජනවාරි 14 දින රු.මිලියන 29.82 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද කාපට් අතුරන යන්ත්‍රය (Asphalt Premix Paving Machine) 2015 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 05 කදී පමණක් මාර්ග වැඩ සඳහා යොදා ගෙන තිබූ බව අනාවරණය විය.

## 3.6 ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම

-------------------------------------

ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබූ අතර සියලු සුදුසු වියදම්ද ඉල්ලීම් කර ලබාගෙන තිබුණි. තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ (යෙන්) ගිණුමේ පැවති රු.මිලියන 9.51 ක වැය නොකළ ශේෂය 2016 පෙබරවාරි 08 දින ආපසු යවා තිබුණි. කෙසේවුවද පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට භාර දෙන ලද වත්කම් පිළිබඳව මුදල් රෙගුලාසි 753 (1) ප්‍රකාරව පවත්වා ගත යුතු භාණ්ඩ භාර දීමේ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘතිය වසා දැමීමේ ගිණුම් පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි.